සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

10 ශ්‍රේණිය **ශිල්ප කලා - I** කාලය පැය 01 යි

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

01. ජනකලාව පිළිබඳ විද්වතුන් විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත.
"කලාවෙන් සතුට ගෙනදේ" යන නිර්වචනය ඉදිරිපත් කළේ කවුරුන් ද?
(1) ආනන්ද කුමාරස්වාමි මහතා (2) මාර්ටින් වික්‍රමසිංහ මහතා
(3) කුමාරතුංග මුනිසාද මහතා (4) යුනෙස්කෝ ප්‍රඥප්තිය

02. දෘශ්‍ය කලාවක් වන්නේ,
(1) ශාන්තිකර්ම (2) වන්නම් (3) ලාක්ෂා කර්මාන්තය (4) ගොයම් කවි

03. බීරළු රේන්ද කලාව ලංකික කාන්තාවන්ට උරුම වන්නේ කුමන ජාතියෙන් ද?
(1) ඉංග්‍රීසීන්ගෙන් (2) ලන්දේසීන්ගෙන් (3) පෘතුගීසීන්ගෙන් (4) ප්‍රංශයෙන්

04. ලාක්ෂා උපයෝගී කරගෙන අලංකාර කර ගත හැකි භාණ්ඩ කාණ්ඩය කුමක් ද?
(1) සැරයටි, වටාපත් මිට, පිත්තල භාණ්ඩ (2) වටාපත් මිට, බීරළු, කළගෙඩි
(3) සැරයටි, වටාපත් මිට, බීරළු (4) ස්වර්ණාභරණ, වෙස්මුහුණු, කළගෙඩි


05. ජ්‍යාමිතික නිර්මාණ කිරීමේ දී කෝණමානය මගින් කරන කාර්යය කුමක් ද?
(1) සරල රේඛා ඇඳීම. (2) මිනුම් ලබා ගැනීම.
(3) චාප ඇඳීම, (4) කෝණ මැනීම හා සලකුණු කිරීම.

06. ඇඳීමේ කඩදාසි සඳහා ජාත්‍යන්තරව සම්මත වූ ප්‍රමාණයන් හඳුන්වා දී ඇත. ඒ අනුව Ao කඩදාසියක සම්මත දිග පළල වන්නේ,
(1) 594 × 841 (2) 847 × 148 (3) 841 × 1189 (4) 210 × 297

07. 5B පැන්සලක් භාවිතයෙන් අඳින ලද, ජ්‍යාමිතික නිර්මාණයක දැකිය හැකි ලක්ෂණය කුමක් ද?
(1) කඩදාසිය අපිරිසිදු වීම. (2) කඩදාසි ඉරී යාම.
(3) අඳින ලද නිර්මාණය පිරිසිදුවට තිබීම. (4) කඩදාසිය පළුදු වීම.


08. ජ්‍යාමිතික නිර්මාණ කිරීමේ දී ඝන අඛණ්ඩ රේඛා භාවිතා කරනු ලබන්නේ,
(1) වස්තුවක පෙනෙනදාර දැක්වීමට. (2) සැඟි දාර දැක්වීමට.
(3) මිනුම් රේඛා දැක්වීමට (4) ඡේදනය කළ යුතු ස්ථාන දැක්වීමට.

09. වෘත්තයේ විවිධ කොටස් භාවිතා කර විවිධ නිර්මාණ කරයි. පහත සඳහන් වෘත්තයේ ලකුණු කර ඇති කොටස් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) A - කේන්ද්‍රික ඛණ්ඩය, B - වෘත්තපාදය, C - වෘත්ත ඛණ්ඩය , D - ජ්‍යාය
(2) A - වෘත්තපාදය, B - වෘත්ත ඛාණ්ඩය, C - වෘත්ත පාදය, D - ජ්‍යාය
(3) A - කේන්ද්‍රික ඛණ්ඩය, B - වෘත්ත ඛණ්ඩය, C - වෘත්ත පාදය, D ජ්‍යාය
(4) A - වෘත්තපාදය, B - කේන්ද්‍රික ඛණ්ඩය, C - වෘත්ත පාදය, D - ජ්‍යාය



A B C D

10. පහත රූපයේ දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණය භාවිතා කරනු ලබන්නේ කුමන නිර්මාණයක් කිරීම සඳහා ද?




(1) පංචාස්‍රයක් නිර්මාණය කිරීම.

(2) රේඛාවක් සමාන කොටස් වලට බෙදීම.

(3) ඕනෑම බහු අස්‍රයක් නිර්මාණය කිරීමේ පොදු ක්‍රමය.

(4) වෘත්තයක් ඕනෑම කොටස් ගණනකට බෙදීම.

11. ආයත චතුරස්‍රයක දැකිය හැකි ලක්ෂණ සහිත පිළිතුර තෝරන්න.


(1) සම්මුඛපාද සමාන හා සමාන්තරවේ.

(2) පාද හා කෝණ සමානය, සම්මුඛ පාද සමාන්තරය.

(3) කෝණ ඍජු කෝණි වේ, විකර්ණ සමාන වේ.

(4) පාද හා කෝණවල අගය අසමාන වේ. සම්මුඛ පාද සමාන්තර නොවේ.

12. ත්‍රිකෝණ පාදවල පිහිටීම හා කෝණවල අගය අනුව වර්ග කර දක්වයි. ඒ අනුව පහත ත්‍රිකෝණය අයත් වන්නේ,



(1) සමද්විපාද ත්‍රිකෝණයකි.

(2) සමපාද ත්‍රිකෝණයකි.

(3) ඍජුකෝණී විෂමපාද ත්‍රිකෝණයකි.

(4) මහාකෝණී විෂමපාද ත්‍රිකෝණය.

13. රෙදි පිළි අලංකරණයේ දී සායම් පෙවීම, ආලේපනයේ දී සිදු කරනු ලබයි. සායම් ආලේපනයේ දී සිදු කරනු ලබන කාර්යය වන්නේ,

(1) මුළු පෙහෙකම් ද්‍රව්‍ය පුරාම වර්ණ පැතිරයාම.

(2) රෙද්දක තෝරාගත් ප්‍රදේශයක බාහිර උපකරණයක් මගින් සායම් ගැල්වීම.

(3) බාහිර උපකරණ ඇසුරින් රෙද්ද මත සායම් මුද්‍රා තැබීම.

(4) බාහිර උපකරණ මගින් බාධක යොදා සායම් ගැල්වීම.

14. අතීත ජනතාව කහ වර්ණය ලබා ගැනීම සඳහා භාවිත කළ ශාකය කුමක් ද?

(1) ගොකටු ගහේ කිරි (2) මකුළු මැටි (3) නිල් අවරිය (4) අඳුන් දැලි

15. නිෂ්පාදිත රෙදිවල ස්වභාවිකව හා බාහිරව එක් වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) කැඳහරණය (2) පෙර පිරියම්කරණය (3) පසු පිරියම්කරණය (4) මලහරණය

16. සේද කෙඳි එකිනෙකට සම්බන්ධ වී ඇති මැලියම් විශේෂ හඳුන්වන නම කුමක් ද?

(1) ජම්බොයින් (2) කෘත්‍රිම ක්ෂලක (3) සෙරසින් (4) ෆැරෆින්

17. හණ කෙඳි ලබාගනු ලබන්නේ ශාකයේ කුමන කොටසකින් ද?

(1) ගෙඩිවලින් (2) පත්‍රවලින් (3) කඳ කොටසින් (4) මුල් වලින්

18. දුම්බර පැදුරු විවීම සඳහා යොදා ගන්නා ශාකය කුමක් ද?

(1) ජූට් (2) හණ (3) මැනිලා (4) සිසල්


19. කෙඳි හඳුනා ගැනීම සඳහා අන්වීක්ෂයෙන් පරීක්ෂා කිරීමේ දී පහත පෙනුම දක්නට ලැබෙන්නේ කුමන කෙන්දේ ද?

(1) කපු කෙඳි ය.

(2) ලෝම කෙඳි ය.

(3) සේද කෙඳි ය.

(4) ප්ලැක්ස් ය.



20. චාම් වියමන් ප්‍රභේද සහිත පිළිතුර තෝරන්න.

(1) චාම් වියමන, ජටා වියමන, සැටින් වියමන

(2) සරල හීරි වියමන, දඟර හීර වියමන, රළ හීර වියමන

(3) ජටා වියමන, දික්දාර වියමන, හරස්දාර වියමන

(4) දික්දාර වියමන, හරස්දාර වියමන, කඩහීරි වියමන

21. මැටි නිර්මාණය වන මාතෘ පාෂාණය හඳුන්වන නම කුමක් ද?

(1) ග්‍රොග් (2) ඩෙලමයිට් (3) ඇලුමිනා සිලිකේට් (4) ෆෙල්ස්පාර්

22. පැහැයෙන් සුදු, නිර්මාණය වූ ස්ථානයේ ම තැන්පත්වන, නම්‍යතාවයෙන් අඩු, මැටි හඳුන්වන නම කුමක් ද?

(1) අගම් මැටි (2) බෝල මැටි (3) පිහිටි මැටි (4) කෙඹලින් මැටි

23. මැටි ජලය සමග එක්වීමේ දී ඇතිවන ඇලෙන සුළු බව හඳුන්වන්නේ,

(1) සවිවරතාවය (2) සුවිකාර්යතාවය (3) හැකිළීම (4) වර්ණය

24. කෙඹලින් මැටි නිධි පිහිටා ඇත්තේ කොහේ ද?

(1) අනුරාධපුර, කෑගල්ල (2) බොරලැස්ගමුව, අම්බලන්ගොඩ

(3) බංගදෙණිය, ගල්ඔය (4) කැලණි ගඟ, කළු ගඟ

25. ග්‍රාමීය කර්මාන්තයක් වන උළු කර්මාන්තශාලා වල නිපදවන බිම්උළු නිපදවීම සඳහා යොදා ගන්නේ,

(1) වියළි මැටි (2) තෙත මැටි (3) මැටිතලපය (4) මැටි දියරය

26. මහා පරිමාණ කර්මාන්ත ශාලාවල භාණ්ඩ සෑදිමේ දී නොඇලෙන සුලු අමුද්‍රව්‍ය කුඩු කර ගැනීම සඳහා භාවිතා කරන යන්ත්‍රය කුමක් ද?

(1) බොල්මිල් යන්ත්‍රය (2) ෆිල්ටර් ප්‍රේෂ් යන්ත්‍රය

(3) රෝල්ර් ක්‍රෂර් යන්ත්‍රය (4) ජෝක්‍රෂර් යන්ත්‍රය

27. යම් මාධ්‍යයක් උපයෝගි කොට ගනිමින් ජීවී හෝ අජීවී වස්තුවක් හෝ මනසින් ගොඩනගාගත් දෙයක් ක්‍රමානුකූලව ගොඩනැගීම හඳුන්වන්නේ,

(1) නෙළීම ලෙසය (2) සීරිම ලෙසය

(3) කැටයම් කැපීම ලෙසය (4) ඇඹීම ලෙසය

28. මැටි තහඩු ආශ්‍රිතව කැටයම් නිර්මාණයේ දී මැටි තහඩුවේ මඳක් හැරීමෙන් මතු කරගන්නා කැටයම් ක්‍රමය වන්නේ,

(1) අර්ධ උන්නත (2) අල්ප උන්නත (3) අධි උන්නත (4) පූර්ණ උන්නත

29. මැටි දරණු භාවිතයෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී මැටි දරණු එකිනෙකට නිවැරදිව සම්බන්ධ කරන්නේ,

(1) මැටි දරණු කඩතොළු කර මැටි පාප්ප ආලේප කිරීම මගිනි.

(2) මැටි දරණු එකිනෙකට තද කිරීම මගිනි.

(3) මැටි දරණු ගම් හා ඇලවීම මගිනි.

(4) මැටි දරණු එකිනෙක මත තැබීමෙනි.

30. පැච්වර්ක් නිර්මාණ කිරීමේ දී රෙදි කැබලි එකිනෙකට සම්බන්ධ කිරීමට භාවිතා කරන මැහුම් ක්‍රමය කුමක් ද?

(1) හුරළු කටු මැස්ම (2) බ්ලැන්කට් මැස්ම (3) පිස්මේන්තු මැස්ම (4) ලේසිඩේසි මැස්ම

31. රූපයෙන් පැච්වර්ක් නිර්මාණය සඳහා හැඩතල කපා ගැනීමේ දී පහසුවෙන් කපාගත හැකි හැඩතලය කුමක් ද ?



(1) ත්‍රිකෝණ කපා ගැනීම.

(2) සමචතුරස්‍ර කපාගැනීම.

(3) වෘත්ත කපා ගැනීම.

(4) සෘජුකෝණාස්‍ර කපා ගැනීම.

32. රිබන් එම්බ්‍රොයිඩර් සඳහා භාවිතා නොකරන මැහුම් ක්‍රමය කුමක් ද?


(1) සිහින් නූල් දුව වීම. (2) රිබන් මැස්ම. (3) කෙලින් මැස්ම. (4) නැටි මැස්ම.

33. රිබන් භාවිතයෙන් නිර්මාණ කිරීමේ දී අයිඩා රෙදිවල මැසීම සඳහා භාවිතා කරන ඉඳිකටු වර්ගය කුමක් ද?

(1) සිහින් ඉඳිකටු (2) මහත ඉඳිකටු

(3) මොට තුඩ සහිත ඉඳිකටු (4) උල්තුඩ සහිත ඉඳිකටු

34. පහත රූප සටහනේ දැක්වෙන විසිතුරු මැස්ම කුමක් ද?




(1) සැටින් මැස්ම

(2) දම්වැල් මැස්ම


(3) කතිර මැස්ම

(4) ප්‍රංශ ගැට මැස්ම

35. ගෙතීම සඳහා භාවිතා කරන උපකරණ සහ මෙවලම් අනුව ගෙතීමේ ක්‍රම එකිනෙකට වෙනස් වේ. ඒ අනුව තැටින් රේන්ද ගෙතීම සඳහා භාවිතා කරන උපරකණය තෝරන්න.




(1)



(2)



(3)



(4)

36. ජේපර් ක්විලින් නිර්මාණවලදී පහසුවෙන් හා ඉක්මනින් කඩදාසි පටිකපා ගැනීමට යොදාගන්නා උපකරණය වන්නේ,

(1) කතුර (2) ජේපර් කටර් එක

(3) කැපුම්තලය (4) කඩදාසි විරූපණ යන්ත්‍රය

37. උද්‍යාන මූර්ති නිර්මාණයේ දී ලෝහවලින් කරන ලද උපකරණය (Tools) වර්ග භාවිත කෙරේ. එම උපකරණ වලින් කරනු ලබන කාර්යයක් නොවන්නේ,

(1) හැඩතල ඇතුලට හැරීම. (2) එබ්බවීම.

(3) අනවශ්‍ය කොටස් ඉවත් කිරීම. (4) දැල් ගැටගසා ගැනීම.

38. අවන්හලක බිතු කැටයමක් නිර්මාණය කිරීමේ දී බිත්ති කඩතොට කරනු ලබයි. එසේ කිරීම හේතුව වන්නේ,

(1) මූර්තියේ පහසුව සඳහා. (2) සමබරතාවය රැකගැනීම.

(3) බදාමය හොඳින් බිත්තියට අල්ලා ගැනීම සඳහා (4) ජල වාෂ්ප උරා ගැනීම සඳහා

39. උද්‍යාන අලංකරණ නිර්මාණ කිරීමේ දී අවධානය යොමු කළ යුතු මූලධර්මක් වන 'අනුපාතය' යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

(1) හැඩතල වල පරිමාව නියමිත ප්‍රමාණවලට යොදා ගැනීම.

(2) සුදුසු ස්ථානයක් තෝරා ගැනීම.

(3) සමබරතාවයක් තිබීම.

(4) නිර්මාණයේ අලංකාරය වැඩි වීමට විවිධත්වයකින් ඉදිරිපත් කිරීම.

40. කඩදාසි පල්ප සාදා ගැනීමේ දී එයට කරාබු නැටි හා / ලින්සිඩ් ඔයිල් එකතු කිරීම හේතුව කුමක් ද?

(1) බන්ධන කාරකයක් නිසා. (2) කෘමි සතුන්ගෙන් ආරක්ෂා වීම.

(3) අත් ඇලීම නවත්වා ගැනීමට. (4) කල් තබා ගැනීමට.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

# ශිල්ප කලා - II

10 ශ්‍රේණිය — කාලය පැය 2 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන පාසල් අතර අධ්‍යාපන ප්‍රදර්ශනය මෙවරත් පැවැත්වේ. මෙම ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට ඔබට ද අවස්ථාව හිමි වේ.

(i) ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන නිර්මාණ සඳහා යොදාගත හැකි අපතේ යන ද්‍රව්‍ය 04 ක් ලියන්න.

(ii) ප්‍රදර්ශනයේ පොල්තෙල් පහන සකස් කිරීමට ඔබට අවස්ථාව හිමි වුවහොත්, ඒ සඳහා නිර්මාණාත්මක පොල්තෙල් පහනක් ඇඳ දක්වන්න.

(iii) විවිධ වියමන් රටා යොදා අලංකාර බඳුන් පලස් ඔබට සෑදිය හැක. ඒ සඳහා සුදුසු වියමන් රටාවක් ඇඳ දක්වන්න.

(iv) ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ආරාධිත අමුත්තන්හට ආරාධනා කිරීමට සුදුසු නිර්මාණාත්මක ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(v) කෘතිම අමුද්‍රව්‍ය යොදා නිර්මාණය කළ හැකි නිර්මාණ 04 ක් නම් කරන්න.

(vi) රෙදි කැබලි ආශ්‍රයෙන් සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණය කළ හැක. ඒ සඳහා යොදා ගත හැකි රෙදි වර්ග 02 ක් ලියන්න.

(vii) ඔබට කඩදාසි මාධ්‍යයෙන් ද විවිධ නිර්මාණ කළ හැක. පේපර් ක්විලින් වලින් බිත්ති සැරසිල්ලකට සුදුසු මෝස්තරයක් අඳින්න.

(viii) ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ හැකි දේශීය ශාක භාවිතයෙන් කළ හැකි භාණ්ඩ 02 ක් නම් කරන්න.

(ix) ඒ සඳහා යොදාගත හැකි ශාක පත්‍ර 04 ක් නම් කරන්න.

(x) වෘත්ත ආශ්‍රිතව නිර්මාණය කළ හැකි ප්‍රදර්ශන භාණ්ඩ 02 ක් නම් කරන්න (ලකුණු 2 x 10 = 20)

(02) පැරණි ශ්‍රී ලංකාවේ සිව් සැට කලාවක් තිබූ බවට මහාවංශයේ සඳහන් වේ. එම පැරණි කලාවන් ප්‍රධාන වශයෙන් කොටස් 02 කි.

(i) එම කලා ප්‍රභේද දෙක නම් කරන්න (ල. 02)

(ii) එවායින් ශ්‍රව්‍ය කලා කර්මාන්ත 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) කාර්මික විප්ලවයෙන් පසු නවීන තාක්ෂණයත් සමග මුසු වී ජනකලා කර්මාන්ත බවට පත් ව ඇත. එවැනි එක් කර්මාන්තයක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල. 04)

(03) පරිසරයේ ඇති බොහෝ වස්තූන් නිර්මාණය සඳහා ජ්‍යාමිතික හැඩතල උපයෝගි කරගෙන ඇත.

(i) කේක් ඇසුරුමක් සඳහා පාදයක දිග 4 cm ක් වූ සමපාද ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න. (ල. 02)

(ii) සෙ. මී. 7 ක් දිග රේඛාවක් ඇඳ එය සමාන කොටස් 05 කට බෙදන්න. (ල. 04)

(iii) අරය 40 mm ක් වූ වෘත්තයක් ඇඳ එය සමාන කොටස් 06 කට බෙදන්න. (ල. 04)

04 ඈත අතීතයේ සිටම රෙදිපිළි නිෂ්පාදනය හා රෙදිපිළි අලංකරණය පැවතුනි.

(i) අතීතයේ දී රෙදිපළි අලංකාර කිරීමට ස්වාභාවික සායම් භාවිතා කර ඇත. වර්තමානය වන විට ස්වාභාවික සායම් ක්ෂය වීමට බලපා ඇති හේතු 02 ක් ලියන්න. (ල. 02)

(ii) ස්වාභාවික අච්චු සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය 04 ක් නම් කර අච්චු මුද්‍රණයේ ඇති වාසි 02 ක් ලියන්න. (ල. 04)

(iii) සිදුරු තහඩු මුද්‍රණය (stencil) මගින් කොට්ට උරයක් අලංකාර කර ගන්නා ආකාරය ලියන්න.(ල. 04)

05 ඈත අතීතයේ ජීවත් වූ මිනිසා ආහාර සපයා ගැනීමට යම් තරම් උත්සහායක් කළ ද එයට නොදෙවිනි උත්සහයක් වස්ත්‍ර සම්පාදනය සඳහා කළ බව දැක්වේ.

(i) රෙදි නිෂ්පාදනය සඳහා කපු වවන රටවල් 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) කෙඳි ලබාගන්නා සත්ත්ව වර්ග 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) රෙදි නිෂ්පාදනයට භාවිතා කරන කෙඳි වර්ගීකරණය කර දක්වන්න. (ල. 04)

06 මානව ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමග පැවත එන කලාවක් ලෙස මැටි ශිල්ප කලාව හැඳින්විය හැක.

(i) ෆෙල්ස්පාර් නම් මාතෘ පාෂාණය දිරාපත් වීමෙන් මැටි නිර්මාණය වේ. මැටි නිර්මාණය වීමට බලපාන ස්වාභාවික හේතු 02 ක් ලියන්න. (ල. 02)

(ii) ප්‍රාථමික මැටිවල හා ද්විතියික මැටිවල ලක්ෂණ 02 බැගින් ලියන්න. (ල. 04)

(iii) මැටි තහඩු භාවිතයෙන් භාණ්ඩයක් නිර්මාණය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

07 විවිධ විසිතුරු නිර්මාණ කිරීම ගෘහ අලංකරණය සඳහා උපකාරි වේ.

(i) රෙදි කැබලි ආශ්‍රයෙන් කළ හැකි ගෘහ ආශ්‍රිත නිර්මාණ 04 ක් නම් කරන්න. (ල. 02)

(ii) උද්‍යාන අලංකරණ මූර්ති සඳහා භාවිතා කරන මාධ්‍ය 04 ක් නම් කරන්න (ල. 04)

(iii) ඉහත ඔබ සඳහන් කළ කැමති මාධ්‍යයකින් උද්‍යාන මූර්තියක් සකස් කර ගන්නා ආකරය ලියන්න. (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 3 ) | 03. ( 2 ) | 04. ( 3 ) | 05. ( 4 ) | 06. ( 3 ) | 07. ( 1 ) | 08. ( 1 ) | 09. ( 1 ) | 10. ( 4 ) |
| 11. ( 4 ) | 12. ( 3 ) | 13. ( 2 ) | 14. ( 1 ) | 15. ( 2 ) | 16. ( 3 ) | 17. ( 3 ) | 18. ( 1 ) | 19. ( 1 ) | 20. ( 3 ) |
| 21. ( 4 ) | 22. ( 3 ) | 23. ( 2 ) | 24. ( 2 ) | 25. ( 1 ) | 26. ( 4 ) | 27. ( 4 ) | 28. ( 2 ) | 29. ( 1 ) | 30. ( 3 ) |
| 31. ( 2 ) | 32. ( 1 ) | 33. ( 3 ) | 34. ( 2 ) | 35. ( 1 ) | 36. ( 4 ) | 37. ( 4 ) | 38. ( 3 ) | 39. ( 1 ) | 40. ( 2 ) |

## II පත්‍රය

(01) (I) පොල් කුඩු, ලී කුඩු, රෙදි කෑලි, හනසු, ඉරටු ...... ආදී

(ii) නිර්මාණාත්මකව ඇඳ ඇති පොල්තෙල් පහන් සඳහා ලකුණු ලබා දෙන්න.

(iii) චාම් වියමන, ජටා වියමන, දික්දාර, හරස්දාර, වියමන් රටා ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(iv) ඇඳ ඇති ආරාධනා පත්‍ර සඳහා ලකුණු ලබා දෙන්න.

(v) බිත්ති සැරසිලි, මාල, වළලු, කරාබු ..... ආදී

(vi) ෆෙල්ට් රෙදි, පොප්ලින්

(vii) පේපර්ක්විලින් ආශ්‍රිත නිර්මාණයක් ඇඳ ඇත්නම් ලකුණු දෙන්න.

(viii) ගල්ලැහැ, තුන්හිරියා, වැටකෙයියා, දුනුකෙයියා

(x) බෝල, මල්, (ඩේලියා මල), ඔරලෝසු

(02) (i) ජන කලාව, විදග්ධ කලාව

(ii) ගොයම් කවි, පැල් කවි, කරත්ත කවි, පතල් කවි

(iii) මැටි කර්මාන්තය, ලාක්ෂා කර්මාත්ය, පන් කර්මාන්තය ආදිය ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(03) (i)
(ii)
(iii) } අදාළ නිර්මාණ කර ඇත්නම් ලකුණු දෙන්න.

(04) (i)
- ★ ස්වාභාවික ද්‍රව්‍ය වලින් නිෂ්පාදනය කරන නිසා වර්ණ සකසා ගැනිමට වැඩි කාලයක් ගත වීම.
- ★ ශාකයන් හි මල් ගෙඩි හට ගැනිම ඍතු අනුව සිදුවීම.
- ★ සායම් නිෂ්පාදනය කාලයට පමණක් සිදු වීම.
- ★ සායම් කල් තබා ගැනීමේ ක්‍රමවේද නොතිබීම.


(ii) කෙසෙල් පිති, හරබරල පිති, බණ්ඩක්කා, නෙළුම් අල

(iii) සිදුරු තහඩු මුද්‍රණය මගින් අලංකාර කරගන්නා අයුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(05) (i) සී දූපත, මිසරය, චීනය, පීරු, ඉන්දියාව

(ii) ලාමා, ඇල්ෆකා, විකුනා, බැටළුවා, එළුවා

(iii)




(06) (i) සූර්ය තාපය, වර්ෂාව, විදුලි කෙටීම, ආර්ද්‍රතාව, හිමපතනය

(ii) ප්‍රථමික මැටි
- ★ නිර්මානය වූ ස්ථානයේම ඇත.
- ★ පැහැයෙන් සුදු වර්ණයක් ගනි.
- ★ නම්‍යතාවයෙන් අඩුය.
- ★ ශේෂ මැටි, පිහිටි මැටි නමින් ද හඳුන්වයි.

ද්විතියික මැටි
- ★ ස්වාභාවිකව ප්‍රවාහනය වී වෙනත් ස්ථානයක තැන්පත් වේ.
- ★ ප්‍රවාහනයේ දී එකතු වන කාබනික සංඝටක නිසා රතු, දුඹුරු, කළු පැහැය ගනී.
- ★ සුවිකාර්යතාව ඉහළය.

(iii) මැටි තහඩු ආශ්‍රයෙන් භාණ්ඩයක් නිර්මාණය කරන අයුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(07) (i) බිත්ති සැරසිලි, කුෂන් කවර, සුරතල් සතුන්, බඳුන් පලස්

(ii) කළුගල්, ලෝහ, කිරිගරුඬ, දැව, මැටි, සිමෙන්ති, ප්ලාස්ටර් ඔෆ්පැරිස්, ෆයිබර්

(iii) ඉහත සඳහන් ඕනෑම මාධ්‍යයකින් මූර්තියක් අලංකාර කරගන්නා අයුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න.